First 25 words - $20.00 .
For each additional word $1.00

පළමු වචන 25 සඳහා ඩොලර් 20.00
අතිරේක වචනයක් ඩොලර් 1.00

Sannasa
PO Box 172 Reservior
VIC 3073 Australia
email: info@sannasa.net

0425 720 932
0422 671 826
03 9796 4241

AUTO CARE

ඔබේ වාහනයේ ඕනෑම අලුත්වැඩියාවක් සඳහා අප අමතන්න

ස්පෝට් ඔන් මොබයිල් මිකැනික්
147 ග්‍රීන්වේල් ඩ්‍රයිව් ග්‍රීන්වේල්

03 9333 4346
0421 285 181

Visiting Tutor
Are you looking for a tutor in mathematics and accounting for your child. Look no further, I am much experienced and qualified in accounts and finance. I am an excellence academic scholarship winner from La Trobe University.
For students from year 4 to VCE and 1st year Uni.

Contact me
Sanjeewa Pothupitiyage
Mobile 0422 138 892
Tel : 03 9460 2408

OFFICE QUIPMENTS

ඉතා හොඳ තත්වයේ Lexmar ලේසර් ප්‍රින්ටර විකිණීමට ඇත $90.00
විමසන්න
0425 866 486

මගේ අදහස

පෙන පිළුම් පුවරුවක් පිටි පැතියක ලත හැකිද?

කවියෙකු හෝ වෙනත් නිර්මාණ කරුවෙකු හෝ පුවත්පත් වාර්තාකරුවෙකු සේ සතයය සහ සත්‍යය පමණක් ම ඉදිපිටත් කල යුතු යැයි මම නොසිතමි. අභිශයෝක්තිය කවියන්ගේ පුම්බනම අළුයක් බව, මිටින් ගත හැකි ඉඟ සුභ, රිය සකසුරුව උකුළු, තිසර තත ගතාදී හොයෙක් යෙදුමෙන් මනාව වැටහේ. පසුගිය සන්තස කළඹෙහි සඳුවූ වි.ක. ධර්මබන්දුවන්ගේ හෙළි කවිය නම් කුදු අභිශයෝක්තියක් හොව අසත්‍යයක් මත පාදා වූ වකි.

ඔසී රටේ සිහළ පුවත් පත්හි හිබඳව පළ වෙන ලිපි මත පදනම්ව ධර්මබන්දුවන් බහුභාෂයෝ යැයි අප හැළ ඇති ඒ තිබූ සිතුවිල්ල කුදු ම්ලිතාවක් පමණක් දැයි දැන් සැක උපදී.

බාලි දුවට මත් කුඩු ගෙන යාමේ වරදට දඬුවම් ලැග් කෝබි මෙනවිය ගැන සරදම්න් ගෙනි තිබූ මෙම හෙළල ළුළුමහිත්ම පදනම් වී තිබුණේ, අඟේ පිටි පැතියේ (back pack) මෙම මත්කුඩු තිබුණය යන අසත්‍යය මතයි. කෝබි මෙනවිය හොදැන අඟේ පිටි පැතියෙහි කෙලෙසක නම් කිලෝග්‍රෑම් සතරක බරට මත් කුඩු දැමීය හැකි දැයි ධර්මබන්දුවෝ උපහාසයේ යෙදෙති. මෙය අසාධාරණයකි. මන්ද යත් එක් පුද්ගලයෙකු හැර සමස්ත ඕස්ට්‍රේලියාව ම දන්නා පරිදි, මත් කුඩු සමුවූයේ කෝබි මෙනවිය ගේ බුලි පුවරු (boogie board) පැතියෙන් බැවිනි. බුලි පුවරුවක් යනු ප්‍රමාණයෙන් කුඩා වූ පෙන පිළුම් පුවරුවකි (surf board) මෙම පැතිය ඇය විසින් ඕස්ට්‍රේලියන් ගුවන් ගොවිපිළ බාර දීමෙන් පසුව එහිදී සහ පසුව සිඩ්නි ගුවන් ගොවිපිළ මළ ඇතළකරුවන් (baggage handlers) අත පත ගා ඇති බව කෝබි මෙනවිය දැක්වූ ප්‍රධානතම ගිදුහසට කරුණද විය. අප රජයද මේ සසඳ ගැන ලිපියක් බාලි කිතිඥයන්ට යවන ලදී.

ඒ කොයි හැටි වුණත් බුලි පුවරුවක් (මෙය ඕවර 1.1ක් පමණ දිගය) සාමාන්‍ය පිටි පැතියක දැමීය හැක්කක් නම් නොවේ. සුවිශේෂ බුලි පුවරු පැතියක් ගුවන්යානයේ අත් මිල්ලක් (hand luggage) ලෙස ගෙන යාමට එහි විමානලන්වය හිසා ඉඩ ලැබෙන්නේ ද නැත. අසත්‍යයක් මත පදනම් වුවද ධර්මබන්දුවන් ගේ හෙළි කවියෙන් යහපතක් ද විය. එනම්, ඔහු විසින් පිටි පැතිය යන වදන පද බැඳීමයි. ඔහුට යහපතක් ම වේවා (Good on him). ඒ යහපත තවත් වැඩි කිරීම සඳහා මම ද ඉගත ඇති පරිදි වදන් කිහිපයක් හැකි පමණින් සැකසුවෙමි.

Surf Board = පෙන ඉපිළුම් පුවරුව = පෙන පිළුම් පුවරුව
Baggage Handlers = මළ ඇතළකරුවන්
Hand Luggage = අත්මිල්ලක්
Good on him = ඔහුට යහපතක්ම වේවා

ඉංග්‍රීසි boogie board යනු දෙදෙම බුලි පුවරුව ලෙස යෙදුවේ boogie යනු ශ්‍රියාපදීංචි වෙළඳ නාමියක් හිසාවෙන් බව කරුණාවෙන් සලකන්න්වා.

ශ්‍රාස්ත්‍රපති හැරිස් පරකන්දෙනිය
නව දකුණු වේල්සයේ සිට

සංස්කරණය සටහන

කෝබි ගේ කතාවේ ධර්මබන්ධු මහතා ගත් අන්තය ගෝ පරකන්දෙනිය මහතා ගත් අන්තය ගෝ නිවැරදි යයි ස්ථිර ලෙස කියන්නට දන්නා කෙනෙක් නැති බව අපේ හැඟීමයි. මේ අන්ත දෙකෙන් කවුරන් ගෝ නිවැරදි විය හැකි ය. මේ අන්ත දෙකටම සාහයෝගය දක්වන පිරිස් සිටින බව ඔස්ට්‍රේලියානු පුවත් පත් හා මත විචාර පෙන්වා දෙයි.

කවියක් හරහා සංවාදයකට පිවිසීම අපූරු අත්දැකීමකි. පරකන්දෙනිය මහතාට අපේ ස්තුතියය. ඔබට යහපතක්ම වේවා.

19 පිටුවෙන්



අස්ට්‍රේලිය ක්‍රීඩාංගනය

අඩුපාඩුවක්ම පැවතීම ද මෙහිලා සලකා බැලිය යුතුම ය. මේවා කෙසේ වෙතත් මුදිගේ අනාගතය පිළිබඳව හොඳ ම සහතිකය ලබාදෙනු ඇත්තේ මෙම තරගාවලිය ය.

මෙම වන විට ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ පරිපාලනය බාරව සිටින්නේ අතුරු පාලක කමිටුවකි. පෙර පැවැති ක්‍රිකට් පාලක මණ්ඩලය ක්‍රීඩා අමාත්‍යවරයා විසින් විසිරුවා හරිනු ලැබූ අකාරය ගැන අපි බොහෝ දේ සටහන් කර ඇත්තෙමු. ඒවා කෙසේ වෙතත් දැන් ශ්‍රී ලංකේය ක්‍රිකට් ක්‍රීඩාවේ වගකිව යුත්තා බවට පත්ව ඇත්තේ අතුරු කමිටුවයි. අතුරු කමිටුව තම පරිපාලනය යටතේ පවත්වන පළමු තරගාවලිය මෙයයි. යම් හොයකින් මෙම තරගාවලියේ දී අඩුපාඩු සිදුවුවහොත්, ශ්‍රී ලංකා පිළට අවාසිදායක තත්වයක් මතුවුවහොත් ඒවායේ වගකීම් ඔවුන් පිට ද පැටවෙනු ඇත. එබැවින් මෙම තරගාවලිය ටොම් මුදිගේ පමණක් නොව ක්‍රිකට් අතුරුපාලක කමිටුවේ අනාගතය ගැන ද සහතිකයක් වනු ඇත.

රග්බි

මේ වන විට ශ්‍රී ලංකාව තුළ ඉහළ යන ජනප්‍රියත්වයකට හිමිකම් කියන ප්‍රධාන ක්‍රීඩාවක් වන්නේ රග්බි ක්‍රීඩාවය. දන් අන්තර් සමාජ රග්බි තරගාවලි රැපවාහිනී තුළින් සජීවිව විකාශනය කරන තරමට ම ශ්‍රී ලංකාවේ රග්බි ක්‍රීඩාව ජනප්‍රිය වෙමින් පවතී. රග්බි ක්‍රීඩාවේ ජනප්‍රියත්වය තවත් ඉහළ නංවන්නට ශ්‍රී ලංකා රග්බි කණ්ඩායම පසුගිය දිනවල සමත් විය.

ලෝක රග්බි කුසලාන තරගාවලියේ මූලික වටයේ තරග ලෙසින් පැවැත්වෙන් ආසියානු කලාපයේ රග්බි තරග මේ දිනවල පැවැත්වෙයි. මේ යටතේ ඉන්දියාවේ පැවැති තරගයක දී ඉන්දීය පිළ ප්‍රබල රජාජයකට හෙළීමට ශ්‍රී ලංකා පිළ සමත් විය. ඉන් අනතුරුව තායිලන්තයේ දී පැවැති තරගයක දී ද තායිලන්තය රජාජය කොට ජය ලැබීමට ශ්‍රී ලංකා පිළ සමත් විය. අනතුරුව සිංගප්පූරුව සමග වන තරගයක් ශ්‍රී ලංකාවේ දී පැවැත් විණ. එහි දී ද ප්‍රබල සිංගප්පූරු කණ්ඩායම පරාජයට පත් කරමින් විශිෂ්ට ජයක් ලැබීමට ශ්‍රී ලංකා රග්බි කණ්ඩායමට හැකි විය. ශ්‍රී ලංකා පිළ ඉදිරියේ දී කසකස්තානය ඇතුළු ආසියාවේ රටවල් කීපයක් සමග තරග වැදීමට නියමිතය. පවත්වාගෙන ආ තරග රටාව අනුව මෙම තරගවල දී ශ්‍රී ලංකා පිළ විශිෂ්ට දක්ෂතා දක්වනු ඇතැයි විචාරකයේ මත පළ කරති. ඒ අනුව මමින් ඉදිරියේ දී පැවැත්වෙන තරග ද ජයග්‍රහණය කොට ශ්‍රී ලංකා කණ්ඩායම ලෝක කුසලාන රග්බි තරගාවලියේ තවදුරටත් දක්ෂමී දක්වීමේ පුරෝ ඉඩකඩක් තිබේ. ඇත්තෙන් ම මෙය ශ්‍රී ලාංකිකයන් හැටියට අපට ආඩම්බර විය යුතු අවස්ථාවක් බව නොකියාව බැරි ය.

මලල ක්‍රීඩා

ශ්‍රී ලංකාවට ඔලිම්පික් ක්‍රීඩා උළෙලක දී පළමු පදක්කම දිනා දුන්නේ ඩන්කන් වයිට් ය. අනතුරුව වසර ගණනාවකට පසු අපට යළිත් එම කීර්තිය දිනා දුන්නේ සුසන්තිකා ජයසිංහ ය.

එතරම් කීර්තියක් මේ රටට ගෙන ආ තැනැත්තියක වුව ද සුසන්තිකා ඇතැම් අවස්ථාවල දී හැසිරුනේ කිසිසේත් අනුමත කළ නොහැකි ආකාරයෙනි. ඇය වළිකවලින් තේරුමක් නැති අන්දමට හතර අතට පහර දුන් අතර ඇතැම් අවස්ථාවල දී තම හයිය පෙන්වීමට ගොස් අධිතරණයට පවා ගියා ය. මෙහි දී ඇය තම කීර්තියට හානි පමුණුවා ගත්තා යැයි කීවොත් වඩාත් නිවැරදිය. මීට සමගාමීව ඇය තම ක්‍රීඩා ජීවිතය ද විනාශය කරා ඇද වර්ධනය ගත්තා ය. තම පෙර පුහුණුකරුවන් විවේචනය කළා ය. පදනමින්ම තොරව සහෝදර ක්‍රීඩකයන් විවේචනය කළා ය. අබාධ මතුවූ බව කියමින් තරගවලින් ඉවත් වූවා ය. මේ සියල්ල අතරතුර ඇය පසුගිය කාලසීමාවේ කිසියම් නිහඬතාවයකට තල්ලු වූවා ය.

වෙනත්, පසුගිය දිනවල ඇය හදිස්සියේ ම සිය නිහඬතාවය බින්දා ය. ඇය කියන්නේ තමන් යළි පුහුණුවීම් අරඹන බව ය. ඒ සඳහා ඇය තෝරාගෙන ඇත්තේ ඇගේ පැරණි පුහුණුකරුවෙකු වන අමේරිකානු ජාතික ටොනි කැම්බල් ය. ළඟදී ම ඔහු මේල්බෝන් පුහුණුව ලැබීම සඳහා අමේරිකාවට යන බවත් අනතුරුව පැවැත්වෙන පොදුරාජ්‍ය මණ්ඩලීය මලල ක්‍රීඩා තරගාවලියේ දී පදක්කමක් දිනා දෙමින් රටට ගෞරවයක් ගෙන දීමට නලපොරොත්තු වන බවත් ඇය සඳහන් කළා ය. සුසන්තිකා පිළිබඳ අකීක කතාවලින් මිඳී ඇගේ අනාගතය වෙනුවෙන් අපි ඇයට සුබ පතමු.

වොලිබෝල්

ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව වොලිබෝල් ය. එහෙත් එයට තිසි තැන හිමිවී ඇත්දැයි සැක සහිත ය. තමන් වොලිබෝල් සම්මේලනයේ සභාපති වූයේ ජාතික ක්‍රීඩාවට අභිමිව ඇති නිසි තැන ලබා දීමේන් ජාතික ක්‍රීඩාව හරහා ජාතික සමගිය යළි ඇති කිරීමේන් පරම පිවිතුරු චේතනාවෙන් බවට එහි අභිනව සභාපතිවරයා වන ලෙස පත්වූ වරය නියෝජ්‍ය අමාත්‍ය ඩිලාන් පෙරේරා පසුගිය දා ප්‍රකාශ කර තිබිණි.

සත්ධාන ආණ්ඩුව බිඳ දමමින් ජනාධිපතිතිය ඒකාධිපති යාන්ත්‍රණයට අත්සන් තැබුවා ය. එහි දී ජනාධිපතිතියගේ අගසව්වෙකු ලෙස කටයුතු කළේ අප මේ කියන ඩිලාන් පෙරේරා නියෝජ්‍ය අමාත්‍යවරයා ය. ඒකාබද්ධ යාන්ත්‍රණය හරහා කොටින්ව සුදු හුණු ගෑ ඩිලාන් පෙරේරා නියෝජ්‍ය අමාත්‍යවරයාට හොඳ අතුල් පහරක් දීමට කොටි පසුගිය දා කටයුතු කළහ. එහෙත් එය සිදුවූයේ යාන්ත්‍රණයට අදාළව නොව, අපි මේ කතාකරගෙන එන වොලිබෝල්වලට අදාළව ය.

ජනාධිපති රන් කුසලාන වොලිබෝල් තරගාවලිය මේ දිනවල දිවයින පුරා පැවැත්වෙන අදාළ තරගවලියේ තරග තරගවල දී ජාතික කොඩිය ඔසවා නොතැබිය යුතු බවටත් එම තරග ජනාධිපති රන් කුසලාන ලෙස හැඳින්වීම නොකළ යුතු බවටත් කොටි නියෝග කොට තිබේ. කොටි කියන අන්දමට එහි දී කිසිදු කොඩියක් එසවිය නොහැකි අතර තරගාවලිය නම් කළ යුත්තේ නිකම්ම රන් කුසලාන තරගාවලිය ලෙස ය. එය සිදුකළ නොහැකි නම් තරගාවලිය පැවැත්වීමට ඉඩ නොදෙන බවට කොටි අවධාරණය කරති.

ඩිලාන් පෙරේරා නියෝජ්‍ය අමාත්‍යවරයා වොලිබෝල් සම්මේලනයේ සභාපතිවරයා හැටියටත් ඒකාබද්ධ යාන්ත්‍රණය වෙනුවෙන් පෙනී සිටි ජනාධිපතිතියගේ සම්පූජක නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හැටියටත් ඉදිරියේ දී කරන්නේ මොනවා දැයි අපි බලා සිටිමු.